# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA


දුරකථනය / Telephone: +94 11 2758230, +94 11 2758220
ෆැක්ස් / Fax: +94 11 2801604
මගේ අංකය / My Number: ASP/02
ඔබේ අංකය / Your Number:

නුගේගොඩ,
ශ්‍රී ලංකාව.
NUGEGODA
SRI LANKA.
තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
POST OFFICE BOX - 6 - NUGEGODA.

Email : drasp@sjp.ac.lk
Web: www.sjp.ac.lk


2021.12.06

**පෙරහැර අංකය:**

ගරු ස්වාමීන්වහන්ස
ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි

**<u>46 වැනි උපාධි ප්‍රදානෝත්සවය</u>**
**<u>(2021 දෙසැම්බර් මස 28, 29, සහ 30)</u>**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 46 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2021 දෙසැම්බර් මස 28, 29 සහ 30 යන දිනවල කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වනු ලැබේ.

මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී 2020 වසරේ උපාධිලාභීන් වෙත උපාධි සහතික පිරිනමනු ලැබේ. ඔබගේ ඉල්ලීම මත දැනටමත් ඔබ උපාධි සහතිකය ලබාගෙන ඇත්නම් එම අවස්ථාවේ දී ඔබට සංකේතාත්මකව උපාධිය පිරිනැමීම සිදු කෙරේ.

දැනට රට තුළ පවතින කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා පනවා ඇති සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශවලට අනුව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රධාන ශාලාවෙහි රැස්විය හැකි පුද්ගලයින් සංඛ්‍යාව සීමා කර ඇති බැවින් මෙම උපාධි ප්‍රදානෝත්සවය සැසි වාර 14 කින් පැවැත්වීමට සැලසුම් කර ඇත.

**පළමුවන සැසිය** - **2021 දෙසැම්බර් මස 28 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව 9.30 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය, විද්‍යාවේදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (විශේෂ) සියලුම උපාධිලාභීන් සඳහා**

**දෙවන සැසිය** - **2021 දෙසැම්බර් මස 28 වැනි දින පෙ.ව. 10.30 සිට මධ්‍යහ්න 12.00 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියට අදාල සියලුම උපාධිලාභීන් සඳහා**

**තෙවන සැසිය** - **2021 දෙසැම්බර් මස 28 වැනි දින ප.ව. 1.00 සිට ප.ව. 2.30 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී (විශේෂ)උපාධියට අදාල උපාධිලාභීන් සඳහා**

**සිව්වන සැසිය** - **2021 දෙසැම්බර් මස 28 වැනි දින ප.ව. 3.30 සිට ප.ව. 5.00 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියට අදාල උපාධිලාභීන් සඳහා**

**පස්වන සැසිය** - **2021 දෙසැම්බර් මස 29 වැනි දින පෙ.ව. 8.00 සිට පෙ.ව. 9.30 දක්වා වෛද්‍ය විද්‍යා පීඨයේ MBBS, B.Sc.Honours in Medical Laborator Sciences, B.Sc. Honours in Nursing, Bachelor of Pharmacy Honours උපාධි වලට අදාල උපාධිලාභීන් සඳහා**

1. **<u>උපාධිලෝගු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:</u>**

01) 2021 දෙසැම්බර් මස 19 සහ 20 යන දිනයන්හි පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා හා පස්වරු 1.00 – 4.00 දක්වා මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සිසුන්ට අදාළ උපාධි ලෝගුව, සාටකය සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

02) 2021 දෙසැම්බර් මස 18 සහ 19 යන දිනයන්හි පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා හා පස්වරු 1.00 – 4.00 දක්වා වෛද්‍ය විද්‍යා පීඨ සිසුන්ට අදාළ උපාධි ලෝගුව, සාටකය සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත

03) 2021 දෙසැම්බර් මස 18 සහ 20 යන දිනයන්හි පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා හා පස්වරු 1.00 – 4.00 දක්වා ව්‍යවහාරික විද්‍යා පීඨයේ සිසුන්ට අදාළ උපාධි ලෝගුව, සාටකය සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

04) 2021 දෙසැම්බර් මස 18 සහ 19 යන දිනයන්හි පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා හා පස්වරු 1.00 – 4.00 දක්වා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ සිසුන්ට අදාළ උපාධි ලෝගුව, සාටකය සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

05) 2021 දෙසැම්බර් මස 18, 19 සහ 20 දිනයන්හි පෙරවරු 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා හා පස්වරු 1.00 – 4.00 දක්වා කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ සිසුන්ට අදාළ උපාධි ලෝගුව, සාටකය සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

- **වැඩි විස්තර සඳහා ඇමුණුම අංක iv බලන්න.**

**උපාධි ලෝගුව ලබා ගැනීම සඳහා රු.4000/-ක ආපසු ගෙවනු ලබන තැන්පතු මුදලක් ලබා ගන්නා අතර, එම මුදල ගෙවූ (රිසිට්පත රැගෙන එන්න.) බව තහවුරු කර ගැනීමෙන් පසුව මෙම ලිපිය සමඟ ශිෂ්‍ය හැඳුනුම්පත (බාර දී නොමැති නම්) හා ශිෂ්‍ය වාර්තා පොත පීඨ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් උපාධි ලෝගුව ලබා ගත හැකිය.**

අදාළ ගෙවීම් සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ ශිෂ්‍ය ගෙවීම් පද්ධතිය වෙත පිවිස එහි ඇති ඔබට අදාල ගිණුම් අංකය භාගත කරගෙන ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම් කළ හැකිය. ඊට අමතරව ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් අන්තර්ජාලය හරහා ද ගෙවීම් කළ හැකිය. එසේ ගෙවීම් කර භාගත කර ගන්නා ලද මුදල් ගෙවීම් කුවිතාන්සිය **2021 දෙසැම්බර් 15** දිනට පෙර සූදානම් කරගත යුතුය. ඔබට උපාධිලෝගු ලබා ගැනීමේ දී ඇතිවන අපහසුතා මඟ හරවා ගැනීම සඳහා ඉහත දිනට පෙර ගෙවීම් කරන්න.

පහත සඳහන් ආකාරයට විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස ගෙවීම් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

www.sjp.ac.lk ➡ For Student ➡ Student Payment ➡ Internal Student ➡ Enter Your NIC Number & Select Faculty ➡ Select 'Refundable Cloak Fee'

උපාධි ලෝගු ලබා ගන්නා අවස්ථාවේ දී මෙම ලිපිය සමඟ එවා ඇති පහත සඳහන් ආකෘති පත්‍ර 03 ද සම්පූර්ණ කර පීඨ කාර්යාලය වෙත බාරදිය යුතුය.

1. උපාධි ලෝගු ගාස්තු නැවත ගෙවීමේ අයදුම්පත (ඇමුණුම i)
2. උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වන අමුත්තන්ගේ විස්තර සම්බන්ධ ප්‍රකාශය (ඇමුණුම ii)
3. උපාධිලාභීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ ප්‍රශ්නාවලිය (ඇමුණුම iii)

## 2. ව්‍යවහාරික විද්‍යා පීඨය

| දිනය | උපාධිය | සැසිය | වේලාව | පෙරහැර අංකය |
|---|---|---|---|---|
| 2021.12.18 (සෙනසුරාදා) | විද්‍යාවේදී (ගෞරව) උපාධිය | හයවන සැසිය | පෙ.ව. 9.00 - පෙ.ව. 10.00 | 001 -035 |
| | | | පෙ.ව. 10.00 - පෙ.ව. 11.00 | 036 - 070 |
| | | | පෙ.ව. 11.00 - මධ්‍යාහ්න 12.00 | 071 - 105 |
| | | | ප.ව. 01.00 - ප.ව. 02.00 | 106 - 140 |
| | | | ප.ව. 02.00 - ප.ව. 03.00 | 141 - 175 |
| | | | ප.ව. 03.00 - ප.ව. 04.00 | 176 - 210 |
| 2021.12.20 (සඳුදා) | විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය | හත්වන සැසිය | පෙ.ව. 9.00 - පෙ.ව. 10.00 | 001 - 040 |
| | | | පෙ.ව. 10.00 - පෙ.ව. 11.00 | 041 - 080 |
| | | | පෙ.ව. 11.00 - මධ්‍යාහ්න 12.00 | 081 - 120 |
| | | | ප.ව. 01.00 - ප.ව. 02.00 | 121 - 160 |
| | | | ප.ව. 02.00 - ප.ව. 03.00 | 161 - 200 |
| | | | ප.ව. 03.00 - ප.ව. 04.00 | 201 - 235 |
| 2021.12.20 (සඳුදා) | විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික විද්‍යා උපාධිය | අටවන සැසිය | පෙ.ව. 9.00 - පෙ.ව. 10.00 | 001 - 016 |
| | | | පෙ.ව. 10.00 - පෙ.ව. 11.00 | 017 - 032 |
| | | | පෙ.ව. 11.00 - මධ්‍යාහ්න 12.00 | 033 - 048 |
| | | | ප.ව. 01.00 - ප.ව. 02.00 | 049 - 059 |
| | | | ප.ව. 02.00 - ප.ව. 03.00 | 060 - 076 |
| | | | ප.ව. 03.00 - ප.ව. 04.00 | 077 - 100 |

